# පොලිස් මාධ්‍ය කොට්ඨාසය
## பொலிஸ் ஊடகப் பிரிவு
## POLICE MEDIA DIVISION
14 වන මහල,සුහුරුපාය,බත්තරමුල්ල

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| දිනය Date | 2025.03.26 පැය 1450 | දුරකථන අංකය Tel.NO | 011-2887973 | මගේ අංකය My NO | D/Media/Out/ 583 /2025 | විද්‍යුත් ලිපිනය E-Mails | dir.media@police.gov.lk |


**ප්‍රධාන කර්තෘ / ප්‍රවෘත්ති කර්තෘ,**
**අධ්‍යක්ෂ ප්‍රවෘත්ති / ප්‍රවෘත්ති කළමණාකරු,**
**සියළුම මාධ්‍ය ආයතන.**

**විදේශිකයින් ත්‍රීරෝද රථ පැදවීම සහ එම අනතුරු අවම කිරීම සම්බන්ධව රථවාහන මූලස්ථානය විසින් නිකුත් කරනු ලබන නිවේදනය.**

ශ්‍රී ලංකාවේ සංචාරය සඳහා පැමිණෙන විදෙස් ජාතිකයන් (පිරිමි හා කාන්තා) විසින් මෙරටදී ත්‍රීරෝද රථ පැදවීමේ ප්‍රවණතාවය ඉහළ ගොස් ඇති අතර පසුගිය කාලසීමාවේදී මේ සම්බන්ධව සිදු වූ මාරක / බරපතල සහ අනෙකුත් අනතුරු ඉහළ ගොස් ඇති බව නිරීක්ෂණය වී ඇත.

මේ සම්බන්ධයෙන් අවධානය යොමු කිරීමේදී අනාවරණය වී ඇත්තේ මෙම අනතුරු වලට අදාලව රිය පදවන ලද විදේශීය ජාතිකයින් සඳහා ත්‍රීරෝද රථ පැදවීම සඳහා බලපත්‍ර නොමැති වීම සහ පුහුණුවක් නොමැති වීම මෙම අනතුරු සිදුවීමට හේතු වී ඇති බවයි.

විදේශීකයෙකුට මෙරටදී වාහන පැදවීම සඳහා පහත සඳහන් බලපත්‍ර වලින් එකක් හෝ අවශ්‍ය වේ.

1. **මෙරට වලංගු රියදුරු බලපත්‍රය.**
2. **මෙරටට වලංගු ජාත්‍යන්තර රියදුරු බලපත්‍රය.**
3. **ඔහුගේ රටේ රියදුරු බලපත්‍රය. (මෝටර් රථ කොමසාරිස් දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කර ලබා ගත් පරිවර්ථන සහතිකය)**

ඉහත සඳහන් බලපත්‍ර වලංගුව තිබිය යුතු අතර ජාත්‍යන්තර රියදුරු බලපත්‍ර නිකුත් කිරීමේදී ත්‍රීරෝද රථ පැදවීම සඳහා වලංගු පංතියක් ඇතුලත් කරනු නොලබයි.

එසේම මෙරටදී සිදුකරන රියදුරු බලපත්‍ර පරිවර්ථනයේදීද ත්‍රීරෝද රථ සඳහා වලංගු බලපත්‍ර නිකුත් කරනු නොලබයි.

ශ්‍රී ලංකාවේ ත්‍රීරෝද පැදවීම සඳහා වලංගු රියදුරු බලපත්‍ර පහත පරිදි වේ.

**<u>පැරණි රියදුරු බලපත්‍රය -</u>**

- A කාණ්ඩය - බර වාහන සඳහා නිකුත් කරනු ලබයි. මෙමගින් ත්‍රීරෝද රථ පැදවීමට වලංගුයි.
- E කාණ්ඩය - මෝටර් ට්‍රයිසිකල් සඳහා වේ.

**<u>නව රියදුරු බලපත්‍රය -</u>**

- B1 මෝටර් ට්‍රයිසිකල්

නව රියදුරු බලපත්‍රයේ ද්විත්ව කාර්ය වාහන සඳහා නිකුත් කරන B කාණ්ඩයේ රියදුරු බලපත්‍රයක් ට්‍රයිසිකලයක් (ත්‍රීරෝද රථ) පැදවීමට වලංගු නොවන අතර ත්‍රීරෝද රථ සඳහා ධාවන පරීක්ෂණය ට ඉදිරිපත් වී ඉන් සමත්ව B1 කාණ්ඩය ලබා ගත යුතු වේ.

C, C1, CE, D, D1 කාණ්ඩ ත්‍රීරෝද රථ පැදවීමට වලංගු වේ.

එසේම මෙරට දී යමෙකුට මෝටර් වාහනයක් පැදවීම පුහුණු කරවන්නේ නම් ඒ සඳහා ලිඛිත පරීක්ෂණයකට ඉදිරිපත් වී එය සමත් වීමෙන් පසුව පුහුණු අවසර පත්‍රයක් ලබා තිබිය යුතු වේ.

මෙම කරුණු මෙසේ වුවද ශ්‍රී ලංකාවට පැමිණෙන විදේශිකයන් සඳහා කිසිදු නීත්‍යානුකූල බලපත්‍රයක් නොමැතිව ත්‍රීරෝද රථ පැදවීමට ඉඩ දී මුදල් උපයා ගැනීමට කටයුතු කිරීම බරපතල තත්ත්වයක් ඇති කරනු ලබයි.

මේ තත්ත්වය වලක්වා ගැනීම හා පාලනය කිරීම සඳහා ගනු ලබන පියවරක් ලෙස යම් විදේශිකයෙකු ත්‍රීරෝද රථ පදවන අවස්ථාවක දී, එම රථයේ අයිතිකරු කැඳවා ප්‍රකාශ සටහන් කොට ඔහුට විරුද්ධව අධිකරණයේ නඩු පැවරීමට පොලිසිය විසින් ඉදිරියේදී කටයුතු සිදු කිරීමට සැලසුම් කර ඇත.

බලපත්‍ර නොමැති අයෙකුට මෝටර් වාහනයක් පැදවීමට ඉඩ දීම මෝටර් වාහන පනතේ 123 (1) ආ අනුව රු 25,000 ක දඩයකට යටත්වන වරදක් වේ. (රථයේ හිමිකරු හට)

විදේශිකයන් සඳහා වාහන ලබා දීමේදී විශේෂයෙන් ත්‍රීරෝද රථ ලබා දීමේදී මෙරට වාහන පැදවීම සඳහා නිසි වලංගු රියදුරු බලපත්‍රයක් සන්තකයේ තිබේද යන්න නිවැරදිව පරීක්ෂා කර බලා අදාල වාහන ඔවුන් වෙත ලබා දීමට කටයුතු කරන ලෙස සංචාරක ක්ෂේත්‍රයේ මෙසේ වාහන ලබා දෙන ආයතන හා හෝටල් හිමිකරුවන්ගෙන් ශ්‍රී ලංකා පොලිසියේ රථවාහන මූලස්ථානය ඉල්ලා සිටී.

**පොලිස් මාධ්‍ය කොට්ඨාසය.**